# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1973/19 - 2016 ජුනි මස 28 වැනි අඟහරුවාදා - 2016.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/15/10/2005

### කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2006.11.23 දින දරන නියෝගයෙන්, බේරුම් කිරීම මගින් විසඳීම සඳහා යොමු කරනු ලැබූ පන්නිපිටිය, කොට්ටාව, මාලඹේ පාර, අංක 9/1607 හි පදිංචි ලෙස්ලි අරඹවෙල මයා සහ කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 500 හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් මා වෙත ලබා දෙන ලද අංක ඒ 3194 දරන ප්‍රදානය 2012.06.14 දිනැති හා අංක 1762/34 දරන රජයේ *අති විශෙෂ* ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලදී.

එම ප්‍රදානය සම්බන්ධයෙන් කාර්මික ආරාවුල් පනතේ 34 වගන්තිය යටතේ බේරුම්කරු විසින් මා වෙත ලබා දී ඇති 2016.06.06 දිනැති අර්ථ නිරූපණය එම පනතේ 18(1) වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 ජුනි මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කාර්මික අධිකරණය, කොළඹ.

ලෙස්ලි අරඹවෙල මහතා,
අංක 9/1607, මාලඹේ පාර,
කොට්ටාව, පන්නිපිටිය.

ඉල්ලුම්කරු

නඩු අංකය : ඒ/3194 සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

වගඋත්තරකරු

වර්ෂ 2016 ක් වූ ජුනි මස 06 වැනි දින දීය.

ඉහත අංක දරන නඩුවේ නඩු විභාගය වෙනුවෙන් මා විසින් 2012.05.14 වැනි දින මාගේ ප්‍රදානය ගරු අධිකරණය වෙත බාර දුන් අතර, එකී නියෝගයට එරෙහිව කොළඹ අභියාචන අධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ වගඋත්තරකරුවන් විසින් අභියෝගයට ලක් කළද මා විසින් දෙන ලද තීන්දුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය අනුමත කර ඇත.

එකී නියෝගය පිළිබඳව අර්ථ කථනයක් ලබා දෙන ලෙස මා වෙත 2016.06.03 වැනි දින නැවත වතාවක් ඉදිරිපත් කර ඇත.

ඒ අනුව මා විසින් එකී ප්‍රදානයේ අවසන් ඡේදයේ සඳහන් කර ඇත්තේ "ඉහත කරුණු අනුව ඉල්ලුම්කරුට ඔහුගේ සේවය නවතා සිටි කාලයට (1999.07.05 දින සිට) හිඟ වැටුප් සහිතව නැවත සේවයේ පිහිටුවන ලෙසට වගඋත්තරකාර පාර්ශ්වයට නියෝග කර ඇත."

එකී කාරණය වැඩිදුරටත් විස්තර කර සිටිනවා නම්, ඉල්ලුම්කරුට 1999.03.10 වැනි දින සිට අඛණ්ඩ සේවය ඇතුළු ශ්‍රේණිගත ඉහළ තනතුරු, උසස්වීම් සහ හිඟ වැටුප් සියළුම ගැලපීම් සමග 1999.07.05 වැනි දින සිට ලබා දිය යුතු බවට මෙයින් දනුම් දෙමි.

නීතිඥ කේ. ඒ. ට්‍රෙවෝ ප්‍රනාන්දු,
බේරුම්කරු.

07 - 588


1 A – G 23719 — 19 (2016/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*